**<u>2022 ජනවාරි මස 13 වන දින පැවති යටිතල පහසුකම්, නිවාස, පුස්තකාල හා තොරතුරු තාක්ෂණ පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාව</u>**

**සහභාගිත්වය**

1. ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවීර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. එම්.ඩී.කේ.විනෝදනි විජේසූරිය මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. කේ.පී.සචිනි නිමේෂ මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. පී.ඒ.ශිවන්ත මලික් කුමාර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. පී.බී.නුවන් චතුරංග මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
6. ජයනී රාජකරුනා මිය - නාගරික ගණකාධිකාරී
7. කේ.පී.එන්.සී.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
8. එන්.පී.කේ.රණසිංහ මිය - පරිපාලන නිළධාරි
9. ඩී.එන්.ප්‍රියන්ති මිය - නීති නිලධාරි
10. එස්.එන්.එම්.පී.එම්.නවරත්න මිය - නියෝජ්‍ය පුස්තකාලයාධිපති
11. පද්මා සෙනෙවිරත්න මිය - සැළසුම් අංශ ප්‍රධානි
12. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

නොපැමිණිම

1. එම්.එස්.එම්.අල් ෆාරිස් මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

- පරිපාලන නිළධාරි විසින් යටිතල පහසුකම්, නිවාස, පුස්තකාල හා තොරතුරු තාක්ෂණ පිළිබඳ ස්ථාවර කමිටුවේ 2022 වර්ෂය සඳහා ජන්ද පත්‍රිකා මාර්ගයෙන් සභාපති තෝරා ගැනිම පෙ.ව.10.00 ට සිදු කරන ලදි. කමිටුව සඳහා සහභාගිවූ ගරු නාගරික මන්ත්‍රීවරු 05 දෙනෙකු ලබාදුන් ජන්ද පත්‍රිකා පරික්ෂා කිරිමේදී පැමිණි සිටි සියළුම නාගරික මන්ත්‍රීවරුන්ගේ ජන්දයෙන් නව සභාපති ලෙස ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.ඩබ්.ඩී. ඩබ්.ටී.විමුක්ති රණවීර මැතිතුමා තේරි පත්විය. මෙම කමිටුවේ ඉදිරි වැඩ කටයුතු කර ගෙන යාම සඳහා නව සභාපති වන ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවීර මැතිතුමා වෙත භාර දෙන ලදී.

- කමිටුවේ සභාපති ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවීර මැතිතුමා විසින් ජන්දය ලබාදුන් සියලුම නාගරික මන්ත්‍රීතුමන්ලාට ස්තුතිය ප්‍රකාශ කරමින් පැමිණ සිටි සියලු දෙනා පිළිගැනිමෙන් අනතුරුව කමිටුවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී.

1. අනුරාධපුර,අගුරුමඩුව පාර,අංක:35/2,ඇලිස් ජයසිංහ මහත්මිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් සිංහ කණුව වටරවුම පෙදෙස අගුරුමඩුව ප්‍රදේශයට ඇතුල් වන මාර්ගය බොරළු දමා නවීකරණය කර ඇතත්, වර්ෂා කාලේදී එම මාර්ගයේ වලවල් සෑදී ගමන් කිරීමට අපහසු තත්වයේ පවතින බව සඳහන් කර ඇත. අගුරුමඩුව මාර්ගය ප්‍රමිතියකට අනුව නවීකරණය කර දෙන ලෙස ප්‍රදේශවාසීන් ඉල්ලීම් කර ඇත.

   මෙම ඉල්ලීමට අනුව කල යුතු කාර්යයන් පිළිබඳ ක්ෂේත්‍ර වාර්තාවක් ලබා ගැනීමට තීරණය විය. (වගකීම - නාගරික ඉංජිනේරු)

2. ගරු නාගරික මන්ත්‍රී කේ.පි.සචිනි නිමේෂා මැතිතුමිය විසින් ලිපියක් යොමු කරමින් පැරකුම් උයන 5 වන පටුමග මාර්ගය ඉතා අබලන් තත්ත්වයක පවතින බැවින් බොරළු යොදා පිළිසකර කර දෙන ලෙස කර ඇති ඉල්ලීම.

   අදාල කොට්ඨාශ භාර තාක්ෂණ නිලධාරි මගින් එහි කලයුතු කාර්ය පිළිබඳව වාර්තාවක් ලබා ගැනීමට තීරණය විය. (වගකීම - නාගරික ඉංජිනේරු)

3. උතුරු මැද පළාත,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පළාත් පාලන කොමසාරිස් විසින් ලිපියක් යොමු කරමින් 2022 වර්ෂයේ සංවර්ධන සැළැස්ම සැකසීම සඳහා පළාත් පාලන ආයතනයට අයත් සංවර්ධන යෝජනා යොමු කරන ලෙස කර ඇති ඉල්ලීම.

   අනුරාධපුර මහා නගර සභාව විසින් ඉදිරිපත් කරන සංවර්ධන යෝජනා,

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුව |
|---|---|---|
| 1 | මහජන පුස්තකාලයේ බිම් මහල ටයිල් කිරීම හා බිත්ති පින්තාරු කිරීම | රු. 6,566,517.20 |
| 2 | කුම්බිච්චන්කුලම ළමා උද්‍යානය සංවර්ධනය හා උපකරණ මිලදී ගැනීම | රු. 3,000,000.00 |
| 3 | මහා නගර සභා කාර්යාල ගොඩනැගිල්ල අළුත් වැඩියාව හා අබලන් වහලය ප්‍රතිසංස්කරණය | රු.50,000,000.00 |
| 4 | මහා නගර සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 15 ට අදාල කාණු පද්ධතිය සංවර්ධනය කිරීම. | රු.15,000,000.00 |
| 5 | අනුරාධපුර මහා නගර භාවේ පශු වෛද්‍ය ඒකකය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම. | රු. 2,000,000.00 |
| 6 | අනුරාධපුර මහා නගර සභාවේ සෞඛ්‍ය සායන මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම. | රු. 3,127,000.00 |

ඉදිරිපත් කර ඇති ඉහත යෝජනා අනුමත කරල ලදි. පළාත් පාලන ආයතනයට යොමු කිරීමට ඒකඟතාවය ලබා දෙන ලදී. (වගකීම - සැළසුම් අංශ ප්‍රධානි)

4. රාජගිරිය,පැරණි කෝට්ටේ පාර,අංක:385 ජේ 3,The Employers' Federation of Ceylon ආයතනය විසින් ආබාධිත පුද්ගලයන්ට ආයතනය තුලට ඇතුල්වීමේ සිට ආයතනය තුල අවශ්‍ය කාර්යයන් සිදු කර ගැනිමට අවශ්‍ය සියළුම පහසුකම් සකස් කරදීමට අදාල යෝජනාව කමිටුව අනුමත කරන ලදි. මේ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු ඉංජිනේරු අංශය වෙත යොමු කරන ලදි. (වගකීම - නාගරික ඉංජිනේරු)

5. අනුරාධපුර ඔරස් අධ්‍යාපන ආයතනය,කේ.එම්.ගුණරත්න මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මෛත්‍රීපාල සේනානායක මාවත දෙවන පටුමග අක්‍රමවත් මාර්ග / කාණු පද්ධතිය සංවර්ධනය කිරිම නිසා ඔරස් අධ්‍යාපන ආයතනයට සහ එහි සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවන් බලවත් අපහසුතාවයකට පත්ව ඇත. මෙම අධ්‍යාපන ආයතනය තුල ජලවහන පද්ධතිය සහ පිවිසුම් මාර්ග ඉදිකිරිම ක්‍රමානුකූලව සකස් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම.

   ඉහත ගැටළුව පිළිබඳව නැවත සමික්ෂණයක් කර කිසිවකු අපහසුතාවයට පත් නොවන ආකාරයෙන් සාධාරණ විසඳුමක් යෝජනා කරන ලෙසට කමිටුව තීරණය කරන ලදී. (වගකීම - නාගරික ඉංජිනේරු)

6. අබලන් තත්ත්වයේ පවතින අනුරාධපුර මහා නගර සභා නිල නිවාස ප්‍රතිසංස්කරණය කිරිම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වෙන් කර ගැනිමට ලිපියක් සකසා අදාල ආයතනයට යොමු කිරිමට තීරණය විය. (වගකීම - පරිපාලන නිලධාරි)

7. වර්ෂා කාලයේදී පැනනගින ගැටළුවක් වන කාණු උතුරා යාමට විසඳුමක් ලෙස වර්ෂා කාලයට පෙර සුදානම්විම සඳහා ඒ ඒ කොට්ඨාශ තුල පවතින වැසි ජලය බැස යන කාණු පද්ධති පිළිබඳ වාර්තාවක් කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස සියළුම නාගරික මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කරන ලිපියක් යොමු කිරිමට තීරණය විය. (වගකීම - නාගරික ඉංජිනේරු)

8. ඩෙංගු මර්ධන වැඩසටහන යටතේ ඉදිරියේදී, නගර සභා බල ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරිමේදී තම ගෙවත්ත ඉදිරිපිට සහ ඉදිරිපිට කාණු පද්ධතිය අපවිත්‍ර වන ආකාරයේ කැළිකසළ බැහැර කිරිම තහනම් කරමින් නියෝගයක් ප්‍රකාශ කිරිම සහ එය කඩ කරන අයට නීතිමය පියවර ගැනිමට කටයුතු කරන බවට දැනුම්දීමට කමිටුව තීරණය කරන ලදී. (වගකීම - ප්‍රධන මහජන සෞඛ්‍ය පරික්ෂක)

ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවිර මැතිතුමා,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,

යටිතල පහසුකම්, නිවාස, පුස්තකාල හා තොරතුරු තාක්ෂණ පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.